# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2091/63 - 2018 ඔක්තෝබර් මස 04 වැනි බ්‍රහස්පතින්දා - 2018.10.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

## වයඹ පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනත සමග කියවිය යුතු 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනතින් සංශෝධිත 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 61 වන වගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් සභාවේ සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල අනුව 1974 ජනවාරි 10 වැනි දින අංක 93/5 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද රීති සඳහා පහත සංශෝධන සිදු කිරීමට වයඹ පළාතේ, පළාත් සභාව විසින් 2018 ඔක්තෝබර් මස 02 වැනි දින අනුමත කොට සම්මත කරන ලද බව නිවේදනය කරමි.

**පියසිරි රාමනායක,**
සමුපකාර සංවර්ධන හා වෙළෙඳ, ඉඩම්, විදුලිබල හා
බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා
කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය.

2018 ඔක්තෝබර් මස 04 වැනි දින,
කුරුණෑගල දී ය.

01. සමුපකාර සමිති රීතිවල 2 වන වගන්තියේ (iii) වන උපවගන්තියට ඉක්බිතිව පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් 2 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(iv) **සමිති සඳහා හා ප්‍රාදේශීය හෝ ප්‍රාදේශික කාරක සභා සඳහා අතුරු ව්‍යවස්ථා මගින් නිශ්චය කරන ලද බල ප්‍රදේශ දැක්වෙන සිතියම ද තිබිය යුතුය.**

02. සමුපකාර සමිති රීතිවල 8 වන වගන්තිය 8(i) උපවගන්තිය ලෙස අංක කිරීමෙන් ද එම වගන්තියට ඉක්බිතිව පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ද 8 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(ii) **අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන කාලයක් තුළ වාර්ෂික මහ සභා රැස්වීම්වලට සහභාගී නොවීම, හෝ අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන ආකාරයට සමිතිය සමග ආර්ථික ගණුදෙනු සිදු නොකිරීම හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරන ලද අවම වටිනාකම ගිණුම්වල පවත්වා නොගැනීම හෝ හේතුවෙන් යම්කිසි සාමාජිකයකු අක්‍රීය සාමාජිකයෙකු බවට පත් කිරීමට මහ සභාවට බලය ඇත්තේය.**

03. සමුපකාර සමිති රීතිවල 9 වන වගන්තිය 9(i) උපවගන්තිය ලෙස අංක කිරීමෙන් ද එම වගන්තියට ඉක්බිතිව පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ද 9 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**(ii) එසේ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමට පෙර එකී සාමාජිකයාගෙන් කරුණු විමසිය යුතු අතර සාමාජිකයාට කරුණු දැක්වීමට දින 14 ක කාලයක් ලබා දිය යුතු වේ. ඒ පිළිබඳව ගන්නා වූ තීරණය ලිඛිතව දින 90 ක් තුළ සාමාජිකයා වෙත දැන්විය යුතුය.**

04. සමුපකාර සමිති රීතිවල 12 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කර 12 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12(i) **සෑම ලියාපදිංචි කළ සමිතියක්ම පහත සඳහන් කරුණු දක්වන සාමාජික නාම ලේඛනයක් මෙම අනුපිළිවෙලට තබා ගත යුතුය :-**

**(අ) සාමාජිකයාගේ සම්පූර්ණ නම**
**(ආ) සාමාජිකයාගේ මුලකුරු සහිත නම**
**(ඇ) සාමාජිකයාගේ මුලකුරු සහිත නම ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)**
**(ඈ) උපන් දිනය**
**(ඉ) ජාතික හැඳුනුම්පත් අංකය**
**(ඊ) දුරකථන අංකය**
**(උ) විද්‍යුත් තැපැල් ලිපිනය**
**(ඌ) සාමාජිකයාගේ ස්ථිර පදිංචි ලිපිනය**
**(එ) ග්‍රාම නිලධාරී වසමේ අංකය හා නම**
**(ඒ) සාමාජික අංකය**
**(ඔ) සාමාජිකයාට අයත් කොටස් ගණන**
**(ඕ) සාමාජිකත්වය ලබාගත් දිනය**
**(ක) සාමාජිකයා විසින් නම් කරන ලද පසු උරුමකරුවන්ගේ නම්**
**(ග) සාමාජිකයාගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ**
**(ච) සාමාජිකත්වය නැති වූ දිනය**
**(ජ) සාමාපිකත්වය නැති වූ හේතුව**

12 (ii) **සෑම සමිතියක්ම සෑම වර්ෂයකම ජුනි 30 වැනි දිනට සාමාජික නාම ලේඛන යාවත්කාලීන කළයුතු අතර සිදුවන සංශෝධන රෙජිස්ට්‍රාර්තුමා නියම කරන ආකාරයට මාස 3 ක් ඇතුළත ප්‍රසිද්ධ කළ යුතුය.**

12 (iii) **ඉහත ආකෘතිය අනුව දැනට ලියාපදිංචි සමිති විසින් ද සාමාජික නාම ලේඛනය සකස් කළයුතු අතර එය මෙම රීති සම්මත වූ දින සිට රෙජිස්ට්‍රාර්තුමා නියම කරන කාලයක් ඇතුළත සිදුකළ යුතුය. එසේ නැවත සකස් කරන ලද නාම ලේඛනය මාස 3 ක් ඇතුළත රෙජිස්ට්‍රාර්තුමා නියම කරන ආකාරයට ප්‍රසිද්ධ කළ යුතුය.**

05. සමුපකාර සමිති රීතිවල 16 වන වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්තිය ආදේශ කිරීමෙන් 16 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16 (i) **සෑම ලියාපදිංචි කළ සමිතියක්ම ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයන් නොවන්නන්ගෙන් ලබාගත හැකි උපරිම ප්‍රමාණය සමිතියේ අවශ්‍යතාවය මත මහ සභා රැස්වීමක දී වරින්වර නියම කර, රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**

(ii) **එසේම සමිතියේ පැවැත්ම උදෙසා අවශ්‍ය වේ යැයි රෙජිස්ට්‍රාර්තුමා අදහස් කරන විට සාමාජික තැන්පත් රැස්කිරීම සම්බන්ධව ද නියාමන පැනවීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇත්තේය.**

06. සමුපකාර සමිති රීතිවල 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

06.1 එහි (i) වන උපවගන්තියේ (අ) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් ද

(i) **(අ) ණය වශයෙන් හෝ තැන්පත් වශයෙන් හෝ වෙනත් අයුරින් හෝ සාමාජිකයන් නොවන්නන්ගෙන් සහ සාමාජිකයන්ගෙන් ලබාගත හැකි උපරිම ප්‍රමාණය නියම කිරීම.**

06.2 (ii) වන උපවගන්තියේ පළමු ඡේදය (අ) ලෙස ද, දෙවන ඡේදය (ආ) ලෙස ද, නැවත අංක කිරීමෙන් ද, තුන්වන ඡේදය ඉවත්කර ඒ වෙනුවට (ඇ) ලෙස අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් ද,

(ii) **(ඇ) නිලවරණයක දී හැර ඡන්ද ගණන සමාන වූ විට සභාපතිවරයාට තීරක ඡන්දයක් ඇති වේ. නිලවරණයක දී ඡන්ද ගණන සමාන වූ විට කුසපත් ඇදීමෙන් තීරණය කළයුතුය.**

06.3 එහි (ii) වන උපවගන්තියට පසුව නැවත (ii) ලෙස නම්කර ඇති උපවගන්තිය (iii) ලෙස අංක කිරීමෙන් ද,

07\. සමුපකාර සමිති රීතිවල 21 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

07.1 එහි (i) (අ) උපවගන්තියේ 21 යන ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට 18 යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද,

07.2 එහි (ඉ) උපවගන්තිය (ඉ) (i) උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ද, (ඉ) (ii) ලෙස අලුත් උපවගන්තියක් ඇතුළත් කිරීමෙන් ද,

(ඉ) (ii) **සමිතියට හෝ වෙනත් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම තුන් මසකට අධික කාලයක් ගෙවීම පැහැර හැර සිට, එම මුදල නිරවුල් කර දොළොස් මසක කාලයක් ගත නොවූ කෙනෙක් හෝ සමිතියට හෝ වෙනත් සමිතියකට හෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු වෙන යම් මුදලක් ආපසු ගෙවීම පැහැර හැර සිට එම මුදල නිරවුල් කර දොළොස් මසක කාලයක් ගත නොවූ කෙනෙක්**

07.3 (එ) හා (ඒ ) ලෙස පහත සඳහන් අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ද,

(එ) **සමිතියේ අතුරු ව්‍යවස්ථාව අනුව, කාරක සභාවේ හෝ දිස්ත්‍රික් කාරක සභාවේ හෝ ප්‍රාදේශික කාරක සභාවේ හෝ සාමාජිකත්වය දැරීමට නුසුදුසු කෙනෙක්,**

(ඒ) **සමිතියේ මහසභාව විසින් අක්‍රිය සාමාජිකයෙකු ලෙස ප්‍රකාශයට පත්කළ කෙනෙක්,**

07.4 එහි (ii) (ඉ) වන උපවගන්තියට ඉක්බිතිව(උ) ලෙස පහත අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ද

(උ) **සමිතියට හෝ වෙනත් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු මුදලක් ගෙවීම තුන් මසකට අධික කාලයක් ගෙවීම පැහැර හැරීම හෝ සමිතියට හෝ වෙනත් සමිතියකට හෝ ඇවරකරුවෙකුට හෝ ගෙවිය යුතු වෙනයම් මුදලක් ආපසු ගෙවීම පැහැර හැරීම:**

07.5 එහි (iii) උප වගන්තියේ 21 යන ඉලක්කම් ඉවත්කර ඒ වෙනුවට 18 යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ද

07.6 එහි (iv) උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ද

(iv) **ලියාපදිංචි කළ සමිතියක කාරක සභාවට හෝ දිස්ත්‍රික් කාරක සභාවට හෝ ප්‍රාදේශික කාරක සභාවට තෝරා පත් කරනු ලැබූ කෙනෙක් එසේ තෝරා පත් වී දින 14 ක් ඇතුළත තමා එසේ තෝරා පත් කිරීමට නුසුදුසු නොවන බවට දිවුරුම් ප්‍රකාශයක් සමිතියේ අතුරු ව්‍යවස්ථාවල නියමිත ආකාරයට කළ යුතුය.**

08\. සමුපකාර සමිති රීතිවල 43 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් 43 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

43\. **(i)** **ආහාර හා සමුපකාර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් සමුපකාර සමිති ආඥාපනතේ (107 වැනි අධිකාරිය) 46 වැනි වගන්තිය යටතේ පනවා, අංක 10086 හා 1950.03.24 දින දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවන ලද සමුපකාර අරමුදල එකී නියෝග මාලාව මේ රීතිවල 55 වැනි රීතියෙන් පරිච්ජින්න කරනු ලැබුව ද, එසේම පවතින අතර, අමාත්‍යවරයාගේ යම්කිසි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව අරමුදල් කමිටුවක් මගින් පරිපාලනය කළ යුතුය.**

**(ii)** එකී අරමුදල් කමිටුවේ සංයුතිය පහත පරිදි විය යුතුය ඃ

අ. **වයඹ පළාත් සභාවේ සමුපකාර විෂයය භාර අමාත්‍යාංශ ලේකම් - අරමුදල් කමිටුවේ සභාපතිවරයා ද විය යුත්තේය ;**

ආ. වයඹ පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) ;

ඇ. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් - අරමුදල් කමිටුවේ ලේකම් ද විය යුත්තේය ;

ඈ. වයඹ ග්‍රාමීය බැංකු සංගමයේ සභාපති ;

ඉ. සමුපකාර දිස්ත්‍රික් මණ්ඩලයක සභාපතිවරයෙකු.

**(iii)** සියළුම සාමාජිකයන්ගේ ධූර කාලය එම සාමාජිකයින්ගේ නිල තනතුරු දරන කාලයට පමණක් සීමා වන්නේය

**(iv)** අරමුදල් කමිටුවේ රැස්වීමක සනපූර්ණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතුය.

**(v)** එකී කමිටුව සඳහා ඇමතිතුමා විසින් අනුමත කරන ලද පාරිශ්‍රමිකයක් ගෙවිය හැකිය.

**(vi)** එකී අරමුදලෙහි මුදල් පහත සඳහන් කරුණු සඳහා යෙදිය හැකිය :-

(අ) සමුපකාර අධ්‍යාපනය, පුහුණුව, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ සහ සමුපකාර පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම හා පවත්වාගෙන යාම ;

(ආ) සමුපකාර සමිතිවල කළමනාකරණය හා ඵලදායිතාවය වැඩි දියුණු කිරීම ;

(ඇ) සමුපකාර සමිතිවලට උපකාර කිරීම ;

(ඈ) සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම.

**(vii)** සෑම ලියාපදිංචි කළ සමිතියක්ම සමිතියේ වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට දහය (10%) ක් හෝ රුපියල් පන්සිය (රු. 500) ක් යන දෙකෙන් වැඩි මුදල සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා ගෙවිය යුතුය.

**(viii)** එකී දායක මුදල ගිණුම් විගණනය කර විගණන වාර්තාව සමිතිය වෙත බාරදුන් දින සිට මාස හයක් ඇතුළත ගෙවා නිමකල යුතුය.

**(ix)** එසේ වුවද අරමුදලේ දායකය මාස තුනක් ඇතුළත සම්පූර්ණයෙන් ගෙවා නිමකරන සමිති සඳහා එම ගෙවූ මුදලින් සියයට විසිපහ (25%) ක ප්‍රමාණයක් සමිතියේ සාමාජික සංවර්ධන අරමුදලකට ආපසු ලබා ගැනීමට සමිතියට හිමිකම් ඇත්තේය. එකී සාමාජික සංවර්ධන අරමුදල පරිහරණය කරන ආකාරය අතුරු ව්‍යවස්ථා හා කාරක නියෝග මගින් සම්මත කොට රෙජිස්ට්‍රාර්තුමාගේ අනුමැතිය ලබාගත යුතුය.

**(x)** සමුපකාර අරමුදල සඳහා දායකය සම්පූර්ණයෙන්ම ගෙවීම, විගණන වාර්තාව සමිතියට බාරදුන් දින සිට මාස 6 ක් ඉක්මවා යන්නේ නම් එකී මාස 6 ඉක්මවූ දින සිට මාසයකට සියයට එක (1% ) බැගින් දඩ මුදලක් සහිතව සමිතිය විසින් එකී මුදල් ගෙවිය යුතුය.

**(xi)** සමුපකාර අරමුදල පරිපාලනය හා කළමනාකරණය කිරීම පිළිබඳ කාර්ය පටිපාටි සකස්කර විෂයය භාර ඇමතිතුමාගේ අනුමැතිය ලබාගත යුතුය.

**(xii)** අරමුදල පරිපාලනය කිරීම පිණිස වන සියළුම වියදම් සමුපකාර අරමුදලට වැය බරක් විය යුත්තේය.

**(xiii)** මෙම අරමුදල වාර්ෂිකව විගණකාධිපති තුමා විසින් විගණනය කල යුතුය.

09. සමුපකාර සමිති රීතිවල 48 වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

09.1 එහි (i) උපවගන්තිය (i) (අ) ලෙස නැවත අංක කිරීමෙන්ද එම උපවගන්තියේ රු.5,000 යන ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට රු.25,000 යන ඉලක්කම් අලුතින් ආදේශ කිරීමෙන් ද

09.2 එහි (i) (අ) උපවගන්තියට ඉක්බිතිව (ආ),(ඇ) ලෙස අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ද

(ආ) **එසේ වුවද සමිතියේ මහ සභාවේ අනුමැතිය හා ඒ ඒ සමිතියේ ක්‍රියාකාරිත්වය පදනම් කරගෙන ඕනෑම චංචල දේපලක් මිලදී ගැනීමට ඒ ඒ සමිතියට සීමාවන සේ රුපියල් ලක්ෂ පහ (රු.500,000 ) ක උපරිමයකට යටත්ව පූර්ව අනුමැතියක් ලබා දීමට රෙජිස්ට්‍රාර්තුමාට බලය ඇත්තේය.**

**(ඇ) ඉහත (i) (ආ)වගන්තිය අනුව ඒ ඒ සමිතිය විසින් පූර්ව අනුමැතිය ලබාගත් සීමාව හෝ එසේ සීමාවන් අනුමත කර නොගත් සමිති රුපියල් විසිපන් දහස (රු. 25,000 ) ක සීමාව හෝ ඉක්මවන සෑම අවස්ථාවකදීම මහා සභාවේ අනුමැතිය ඇතිව එක් එක් චංචල දේපල මිලදී ගැනීම සඳහා රෙජිස්ට්‍රාර්තුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.**

09.3 48 (iii) ලෙස උපවගන්තියක් අලුතින් එකතු කිරීමෙන් ද

48. **(iii) ඉහත (i) හා (ii) උපවගන්ති වල සඳහන් ආකාරයට චංචල හෝ නිශ්චල දේපල මිලදී ගැනීමේදී රෙජිස්ට්‍රාර්තුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටීන් අනුගමනය කළ යුතුය.**

10. සමුපකාර සමිති රීතිවල 49 වගන්තියේ (xii) (අ) උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට අලුත් වගන්තියක් ආදේශ කිරීමෙන් ද 49 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**(xii)** (අ) **බේරුම්කරුවෙකුගේ හෝ බේරුම්කරුවන්ගේ හෝ තීන්දුවකට විරුද්ධව රෙජිස්ට්‍රාර්තුමාට කරන ඕනෑම ආයාචනයක් ඊට හේතු ලියවිල්ලකින් දක්වමින් තීන්දුව දෙන ලද දින සිට දින 30ක් ඇතුළත කළ යුතුය. තව ද තීන්දුව දෙන ලද්දේ යම්කිසි පාර්ශ්වකරුවෙකුට විරුද්ධව ද, ඒ පාර්ශ්වකරු විසින් ආයාචනයක් කරන කළ රුපියල් පනස්දාහක් (රු. 50,000ක්) ද, ඒ තීන්දු කරන ලද මුදලෙන් සියයට පහ 5% ක් ද, යන ප්‍රමාණ දෙකෙන් අඩු ප්‍රමාණය ආයාචනය සඳහා තැන්පත් මුදලක් වශයෙන් ආයාචනය සමග යැවිය යුතුය. ආයාචනය කරන්නේ මුදලක් ඉල්ලා සිටින පාර්ශ්වකරුවකු විසින් නම්, රුපියල් පනස්දාහක් (රු. 50,000 ක්) ද, ඒ ඉල්ලා සිටින මුල් මුදලෙන් සියයට පහ 5% ක් ද, යන ප්‍රමාණ දෙකෙන් අඩු ප්‍රමාණය ආයාචනය සඳහා තැන්පත් මුදලක් වශයෙන් ආයාචනය සමග යැවිය යුතුය.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.